# ගමේ සටනින් ඇසුණු කතා



## පාලම්-බෝක්කු සංවර්ධනයෙන් ඔබ්බට ගිය මහජන සේවයකට අපි සූදානම්

### මතුගම ප්‍රාදේශීය සභා අපේක්ෂක අමිල බාලසූරිය (ජාතික ජන බලවේගය)

**නිපුනි ශාරදා**



පළාත් පාලනය යනු මහජනතාවට සමීප විය හැකි පුංචිම ආණ්ඩුව බව මතුගම ප්‍රාදේශීය සභා ඕවිටිගල කොට්ඨාස ජාතික ජන බලවේග අපේක්ෂක අමිල බාලසූරිය මහතා පැවසීය.

ඒ මහතා වැඩිදුරටත් අදහස් දක්වමින් මෙසේද කීය.

"සාමාන්‍යයෙන් මෙතෙක් ප්‍රදේශීය සභාවන්ට පත්ව ආ බොහෝ දෙනෙක් සිදු කර ඇත්තේ සහ සභාවන් තුළින් සිදුව තිබෙන්නේ එකම කොන්ක්‍රීට් එක දෙතුන් වතාවක් ප්‍රතිසංස්කරණය කරමින් ප්‍රතිපාදන ලබාගෙන, ඒවා තම තමන්ගේ පසුම්බිවලට දාගත්තු එක. බොහෝ දෙනාට පළාත් පාලනය කියලා ජනගත කර තිබෙන්නේ ලයිට් කණුවට බල්බ මාරු කරන එක, පාර සාදා දෙන එක, ගමේ බෝක්කුව, ගෙදර පාර හදා දෙන එකයි. හැබැයි පළාත් පාලනය කියන්නේ ඒකට නෙවෙයි. පළාත් පාලනය කියන්නේ මහජනතාවට කිට්ටු වෙන්න තියෙන පුංචිම ආණ්ඩුව. ඒ කියන්නේ ජාතික දේශපාලනය ගම් මට්ටමට ගෙන ඒමට ඇති පහසුම ක්‍රමය. ඒක මෙච්චර කාලයකට සිද්ධ වෙලා නෑ. පසුගිය කාලය පුරාවටම සිදු වුණේ පාලකයන්ගේ අවශ්‍යතාවයන්ට පළාත් පාලන බලය යොදා ගත් එකයි. නමුත් ඉන් ඔබ්බට ගිය සේවයක් ජනතාව වෙනුවෙන් සිදු කිරීම තමයි අපේ මූලික අරමුණ. ඊට අමතරව ප්‍රදේශයේ අවට ඉන්න ගමෙන් බිහිවුණු ගුරුවරු එකතු කරගෙන දරුවන්ට නොමිලේ අධ්‍යාපන වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නත් බලාපොරොත්තු වෙනවා."

## දූෂණය-භීෂණය නැති සංවර්ධිත රටක් හදන්න ගමෙන් පටන් ගන්නවා

### කන්තලේ ප්‍රාදේශීය සභා අපේක්ෂක අලාබ්දීන් මොහොමඩ් අලීම් (ජාතික ජන බලවේගය)

**ත්‍රිකුණාමලය විශේෂ ඒ.ටී.එම්. ගුණානන්ද**

දූෂණයෙන්, භීෂණයෙන් තොර රටක් දියුණු කළ හැක්කේ ජාතික ජන බලවේග ආණ්ඩුවකට පමණයි. ඒක ගමේ කවුරුත් තේරුම් අරන් තියෙන්නේ. පසුගිය කාලේ ඡන්දයට ඉදිරිපත් වූ පරණ මුහුණු දැන් නැහැ. මම විතරයි පරණ කෙනකුට ඉන්නේ. ඒකෙන්ම පේනවා ඡන්දය ඉල්ලන්න ඇතැම් පක්ෂවලට අපේක්ෂකයෝ නැති බව.ʻ යැයි ජාතික ජන බලවේගයේ කන්තලේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීධුර අපේක්ෂක අලබ්දීන් මොහොමඩ් අලීම් මහතා පැවසීය.

හෙතෙම වැඩිදුරටත් මෙසේද කීය.

"මම 2018 සිට ජනතා විමුක්ති පෙරමුණේ පක්ෂ ක්‍රියාකාරිකයෙක්. මාත් එක්ක මගේ කොට්ඨාසයට තරග කරන හය දෙනාම අලුත් මුහුණු. පරණ අය ඉවත් වෙලා. ඒකෙන් පේනවා අපේ ජයග්‍රහණය. මේ ප්‍රදේශයේ ගංවතුරට නිවාස යට වෙනවා. ජලය බැස යන කානු හදන්න මේ සැරේ අය - වැයෙන් සල්ලි වෙන් කළා. ඒ වගේම තමයි කන්තලේ



පේරාරු කියන ගමේ තියෙන ළමා උද්‍යානය. ඒ උද්‍යානය විනාශ වෙලා. ළමා උද්‍යානයක් ලෙසත්, ප්‍රදේශයේ ජනතාවට සවස් කාලයේ විවේකීව ගත කරන ස්ථානයක් ලෙසත් එය හදන්න පළාත් සභාවෙන් මුදල් වෙන් වෙලා තියෙනවා. මේ උද්‍යානය ප්‍රාදේශීය සභාව සතුයි. අපි ප්‍රාදේශීය සභාවේ බලයට ආවම මේ උද්‍යානය ලස්සනට පරිපාලනය කරනවා."

## වෘත්තීය අධ්‍යාපනයෙන් බිහිවන ප්‍රාදේශීය සංවර්ධනයකට පාර හදනවා

### අගලවත්ත ප්‍රදේශීය සභා අපේක්ෂක නුවන්ත ජයවීර (ස්වාධීන කණ්ඩායම අංක 1)

**ඉෂාරා දේවින්දනී**

සංවර්ධනය සිදු විය යුත්තේ යටිතල පහසුකම් නංවාලීම තුළින්ම පමණක් නොවන බවත්, එය වෘත්තීය අධ්‍යාපනය හා සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම තුළින් වඩාත් අර්ථවත්ව සිදු කිරීමට තමා බලාපොරොත්තු වන බවත්, අගලවත්ත ප්‍රාදේශීය සභාවට ස්වාධීන කණ්ඩායම් අංක 1 යටතේ තරග වදින නුවන්ත ජයවීර මහතා සඳහන් කළේය.

ඒ මහතා වැඩිදුරටත් මෙසේද කීය.

"අපේ සාම්ප්‍රදායික දේශපාලනය තුළ ජනතාව සිතාගෙන ඉන්නේ සංවර්ධනය කියන්නේ, යටිතල පහසුකම් සංවර්ධනය පමණයි කියලා. බිම් මට්ටමේ දේශපාලනයේදී මිනිස්සු ඉල්ලන්නේ පාරවල්, ලයිට්, බෝක්කු විතරයි. නමුත් සංවර්ධනය කියන නිර්වචනය තුළ කතාවක් ගැබ්ව තිබෙනවා. රූපවාහිනිය ලකුණෙන් ඉදිරිපත් වන අපේ කණ්ඩායමේ සහ මගේ අදහස වෙන්නේ මිනිසුන්ගේ ආර්ථිකය නංවාලීමේ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයි කියන එකයි.



ඒ අනුව මම පෞද්ගලිකව වැඩි අවධානයක් යොමු කරනවා අගලවත්ත ප්‍රදේශයේ වෘත්තීය අධ්‍යාපනය සහ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම පිළිබඳව. වෘත්තීය අධ්‍යාපනය දෙස අවධානය යොමු කළොත් අගලවත්ත සම්පත් උල්පතක්. මෙහෙ ජේෂකර්ම මධ්‍යස්ථානයක් තියෙනවා. අද හෑන්ඩ්ලූම් සාරියක මිල දිහා බැලුවහම මේ මධ්‍යස්ථානය දියුණු කළොත් ගමට හොඳ ආර්ථික ශක්තියක් ඇති කළ හැකියි. ඒ වගේම ඒ සමීපයේම තිබෙන මැණික් කපන ස්ථානය අපට ඇති තවත් සම්පතක්. අනෙක තමයි මෙහෙ තියෙන වඩු ඉස්කෝලෙ. අවුරුදු 40කට වඩා පැරණි මේ පාසලේ ජලනළ කාර්මික, වෑල්ඩින්, මේසන්, වඩු වගේ NVQ 3 මට්ටමේ පුහුණු ලබා දීලා විදෙස් රැකියා වෙළෙඳපොළට තරුණ තරුණියන් හැකියාවත් සමඟ යැවීම තමයි මගේ බලාපොරොත්තුව. ඒ වගේම සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න මේ අවට තිබෙන ස්වභාවික සම්පත් ටික හොඳටම ප්‍රමාණවත්. ඒවා දියුණු කරලා ආර්ථික වශයෙන් ශක්තිමත් ජනතාවක් බිහි කිරීම තමයි අපේ අරමුණ."

## ජනතාව ඉල්ලන තරමට නගරය සංවර්ධනය කරනවා

### මතුගම ප්‍රාදේශීය සභා අපේක්ෂක යොෂාන් මධුරංග (ස්වාධීන කණ්ඩායම්)

**උදාරා පාරමී**

ඉදිරි මැතිවරණවලදීත් ජනතාව තමාවම ඉල්ලා සිටින තත්ත්වයට ගමට, නගරයට සංවර්ධනය හා සේවයක් කිරීම වෙනුවෙන් තමන් කැප වන බව මතුගම ප්‍රාදේශීය සභාවට මතුගම බටහිර කොට්ඨාසයෙන් 'කොස්ගෙඩිය' සලකුණ යටතේ තරග වදින ස්වාධීන කණ්ඩායම් අපේක්ෂක යොෂාන් මධුරංග මහතා පැවසීය.

ඒ මහතා වැඩිදුරටත් මෙසේද කීය.

"තරුණ නියෝජනය යටතේ මතුගම ප්‍රාදේශීය සභාවට මම මෙවර තරග වදින්නේ "එක්ව හදමු ලස්සන මතුගමක්" යන තේමා පාඨය පෙරදැරි කරගෙනයි. මතුගම නගරය කියන්නේ මේ වන විට අඩුපාඩු රැසක් පවතින නගරයක්. ඒ අඩුපාඩු මඟහැර ප්‍රදේශයේ දියුණුව වෙනුවෙන් උපරිමය සිදු කිරීමට මම



බලාපොරොත්තු වෙනවා. අනෙක් ප්‍රධානම දේ තමයි, බොරුවෙන්, වංචාවෙන් තොර වුණු ලස්සන, පිරිසුදු නගරයක් විදියට මතුගම නගරය පත් කිරීම තමයි මගේ අරමුණ. මගේ බල ප්‍රදේශයේ පවතින අඩුපාඩු හඳුනාගෙන ඒවා හැකි ඉක්මනින් සකස් කර දෙන්නත්, සෑම මසකම මාර්ගය දෙපස පිරිසුදු කිරීම් සිදු කර, ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළක් ක්‍රියාවට නංවන්නත් කටයුතු කරනවා. මාව මෙවර මතුගම ප්‍රාදේශීය සභාවේ සභිකයකු ලෙස පත්කිරීමට ජනතාව පියවර ගතහොත් ඉදිරි වතාවන්වලදී "අපට අවශ්‍ය යොෂාන් මධුරංගම තමයි." කියන තරමටම මම ගම හදනවා. අපි කණ්ඩායමක් වශයෙනුත්, පෞද්ගලිකව මමත් සෑමවිටම ජනතා සේවය වෙනුවෙන් කැපවෙන බව මෙවර මැතිවරණ ජයග්‍රහණයත් සමඟ ඔප්පු කර පෙන්වීමට අපි සූදානම්."

## මේ ආණ්ඩුව රැකගත්තොත් අයිතිවාසිකම් වෙනුවෙන් සටන් අවශ්‍ය නෑ

### කෑගල්ල මහනගර සභා අපේක්ෂක සනත් පතිරණ (ජාතික ජන බලවේගය)

**ජයසිරි මුණසිංහ**



මෙතෙක් පැවැති ආණ්ඩු කිසිවකින් නොලැබුණු ආකාරයේ වරප්‍රසාද සහ අයිතිවාසිකම් රැසක් වත්මන් ආණ්ඩුවෙන් රාජ්‍ය සේවකයන්ට ලැබුණු බව කෑගල්ල මහනගර සභාවේ ජාතික ජන බලවේගයේ මන්ත්‍රී ධුර අපේක්ෂක සනත් පතිරණ මහතා ප්‍රකාශ කළේය.

ඒ මහතා වැඩිදුරටත් අදහස් දක්වමින් මෙසේද පැවසීය.

"දැන් තිබෙන්නේ වැඩකරන ජනතාවගේ පාලනයක්. එදා රට දුප්පත් වුණත් පාලකයා පොහොසත් වුණා. දැන් අපට ඕනෑ අපි හැමෝම පොහොසත් වෙන්න. අන්න ඒ සඳහා අපි හැමෝම මේ පාලනයත් සමඟ අත්වැල් බැඳගන්න ඕනෑ. මේ ආණ්ඩුව රැකගත්තොත් සටන් නොකර අයිතිවාසිකම් දිනාගන්න පුළුවන්කමක් ලැබෙනවා. රාජ්‍ය සේවයට වෙන කවරදාකවත් නොලැබුණු අයිතිවාසිකම් ලැබුණා පසුගිය අය - වැයෙන්. මෙම මැතිවරණය පුංචි මැතිවරණයක් යැයි නොහිතා පටු නොකර ජාතික මැතිවරණයක් කියලා හිතලා ගමේත්, නගරයේත්, බලය, පාලනය මාලිමාවට ලබා දීමට රාජ්‍ය සේවයේ ඔබ හැමෝගේම වටිනා ඡන්දය මාලිමාවට ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා."

## ආණ්ඩුවට පාඩමක් උගන්වන්න ජනතාව මඟ බලන් ඉන්නවා

### පදියතලාව ප්‍රා. සභා අපේක්ෂක එම්.පී. අමරසිරි (සමගි ජන බලවේගය)

**පදියතලාව සමූහ ඒ.එම්. වසන්ත කුමාර**



"මාලිමා ආණ්ඩුවට කියපු දේවල් කර ගන්න බැරි වුණු හින්දා මෙදා පාර ආණ්ඩුවට යස පාඩමක් උගන්වන්න ජනතාව මැයි 6 වැනිදා මඟ බලන් ඉන්නවා." යැයි සමගි ජන බලවේගයෙන් පදියතලාව ප්‍රාදේශීය සභාවට සරණගම කොට්ඨාසයෙන් තරග වදින එම්.පී. අමරසිරි මහතා පැවසීය.

වැඩිදුරටත් අදහස් දක්වමින් හෙතෙම මෙසේද කීය.

"මෙදා පාර ශක්තිමත් කණ්ඩායමක් අපි ඉදිරිපත් කර තිබෙවො. සභාවේ බලය හිමි කර ගැනීම තමයි අපේ පැතුම. මමත් මගේ බිරියත් මේ දක්වා ඉදිරිපත් වුණු එක ඡන්දයක්වත් පැරදිලා නෑ. මේ පාරත් ලොවෙත් නැති වෙන්න ඡන්දය දිනනවා. මම දේශපාලනයට එන්න හිටපු කෙනෙක් නොවෙයි. 2008දී බලයේ සිටි පාර්ශ්වයේ මැර කණ්ඩායමක් ඇවිත් මටයි, මගෙ බිරියටයි පහර දුන්නා. බිරියගේ ඇසකටත් බරපතළ හානි කළා. අන්න ඒ සිද්ධිය තමයි මගේ දේශපාලන ආගමනය. අපට බලය තිබුණ කාලේ ජනතාවට දැනෙන්න වැඩ කොටසක් කළා. අනිත් අය වගේ පාරවල් කොන්ත්‍රාත් අරන් ගසා කෑවා කියලා කියන්න ඉඩක් තියලා නෑ. අපේ අත්වල ජරාව ගෑවිලා නෑ. මම ජය අරන් සරණගම ගම්මානය කිසිම අඩුපාඩුවක් නැති ගම්මානයක් බවට පත් කරනවා."

## ආදායම නිසි ලෙස කළමනාකරණය කර ජනතා සුබසිද්ධියට යොදවනවා

### කුච්චවේලි ප්‍රාදේශීය සභා අපේක්ෂක අයිනියපිල්ලේ මුබාරක් (ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය)

**ත්‍රිකුණාමලය විශේෂ ඒ.ටී.එම්. ගුණානන්ද අමරජීව**

ʻමම කුච්චවේලි ප්‍රාදේශීය සභාවේ අවුරුදු දහයක් සභාපති ලෙස කටයුතු කළා. ඒ කාලයේ තෙන්නමරවාඩි සිට පෙරියකුලම් දක්වා මුළු ප්‍රාදේශීය සභා බලප්‍රදේශයම ආවරණය වන විදිහට විශාල වැඩ කොටසක් කළා. ජනතාවගේ තිබුණු ප්‍රශ්නවලින් සියයට 75ක් අවසන් කරලා තිබුණේʻ යැයි ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ කුච්චවේලි ප්‍රාදේශීය සභා මන්ත්‍රීධුර අපේක්ෂක අයිනියපිල්ලේ මුබාරක් මහතා පැවසීය.

ඔහු වැඩිදුරටත් මෙසේද කීය.

"දියුණු වෙමින් තිබූ සංචාරක කර්මාන්තය සහරාන්ගේ ප්‍රහාර නිසා හා කොරෝනා නිසා කඩා වැටිලා තිබුණේ. ඒ සංචාරක කර්මාන්ත යළි නඟාසිටුවීමට අප පියවර ගත්තා. මේ සැරේ ස්ථිර වශයෙන්ම මම ජයග්‍රහණය කරනවා. ජයග්‍රහණයෙන් පසුව මේ ලැබෙන ආදායම් නිසි කළමනාකරණයක් කරලා සභා බලප්‍රදේශයේ ජනතාවගේ සුබසාධන කටයුතුවලට යොදවලා සභාවෙන් වෙන්න ඕන කටයුතු සියල්ලක්ම ඉටුකර දීමට මම සැලසුම් සකස් කර තිබෙනවා. ඒ සඳහා ජනතාවගේ අතේ තමයි වැඩේ තියෙන්නෙ."



## අපි ඉන්නේ ජනතාව එක්කයි: ඡන්දය අභියෝගයක් නෙවෙයි

### කොළඹ මහනගර සභා අපේක්ෂක එම්.එච්. මොහොමඩ් (එක්සත් ජාතික පක්ෂය)

**බොරැල්ල විශේෂ - බන්දුල අලහකෝන්**



තමන් බිම්මට්ටමේ ජනතාව සමඟ සෑම විටම ජීවත්වන බැවින් නගර සභා ඡන්දය කිසිදු අභියෝගයක් නොවන බව කොළඹ මහනගර සභා බොරැල්ල ආසන එක්සත් ජාතික පක්ෂ අපේක්ෂක එම්.එච්. මොහොමඩ් මහතා සඳහන් කළේය.

ඔහු වැඩිදුරටත් මෙසේද කියා සිටියේය.

"පොදු පහසුකම් ප්‍රශ්න තමයි මේ අයට තියෙන ලොකුම ප්‍රශ්නය. පසුගිය කාලයේ බොරැල්ල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ජාති ආගම් කුල භේද නොතකා ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් ව්‍යාපෘති ගණනාවක්ම ක්‍රියාත්මක කළා. කොළඹ නගර සභාව හරහා තමයි මේ හැම ව්‍යාපෘතියක්ම ක්‍රියාත්මක කළේ. ඒ නිසා ජනතාව අප සමගයි ඉන්නේ. රනිල් වික්‍රමසිංහ මහතා බොහොම දුර පෙනෙන නායකයෙක්. ඒනිසා තමයි අපි හැමදාම මේ පක්ෂය තුළ ඉන්නේ. මෙවර කොළඹ නගර සභාවට අලුත් පරපුරේ බොහෝ පිරිසක් තරග කරනවා. කොළඹ ජනතාව බොහොම බුද්ධිමත්. විශේෂයෙන් බොරැල්ලේ ජනතාව වැඩ කරපු අයව අමතක නොකරන ජනතාවක්. මොන රජයක් තිබුණත් නාගරික මන්ත්‍රී කෙනෙක් හැටියට අපේ සේවය අපේ ජනතාවට ලබා දෙනවා. අපි ජනතාව සමඟ නම් ජනතාව අපව පිළිගන්නවා."

## අපි ඉන්නේ සක්‍රිය පරිවර්තන යුගයක: කළගුණදත් අය යළි අප වටා එක්වුණා

### මාතලේ මහ නගර සභා අපේක්ෂක - නිශාන්ත ඩයස් බණ්ඩාර (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ)



**තක්ෂිලා උදයංගනී**

මාතලේ මහ නගර සභාව මාතලේ නගරයේ යම් වැඩ කොටසක් කළා නම්, ඒ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු රජයක් යටතේ බව, මාතලේ මහ නගර සභාවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කණ්ඩායම් නායක නිශාන්ත ඩයස් බණ්ඩාර මහතා පැවසීය.

ඒ මහතා වැඩිදුරටත් මෙසේද කීය

"අපි පසුගිය කාලයේ කිසියම් පසුබෑමකට ලක් වුණත්, නැවත ඉතාමත් සක්‍රිය පරිවර්තන යුගයකට එළැඹ තිබෙනවා. පළාත් පාලන ආයතනවල නායකත්වය මෙවර ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ලබා ගැනීමේ ක්‍රමවේදයකට අපි එක් වෙලා තියෙනවා. රට සැබෑවටම සංවර්ධනය කරපු එකම පක්ෂය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණයි. ඒ නිසා කළගුණ දන්න කෘතහස්ත පිරිසක් මෙවර නැවත වරක් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ වටා එක්රැස් වෙමින් පවතිනවා."

## සරණක් අවැසි ජන ජීවිත නඟා සිටුවීමට කටයුතු කරනවා

### ගොඩකවෙල ප්‍රා. සභා අපේක්ෂක සංජීව සමන්ත (පො.ජ.එ.පෙ)

**රක්වාන - ඉන්දික සී. කුමාර**



වත්මන් ආණ්ඩුව දිගින් දිගටම රාජ්‍ය නිලධාරීන් මුළා කරමින් සිටින බවත්, රාජ්‍ය නිලධාරීන්ට ලබා දෙන ආපදා ණය මුදල උපරිම සීමාව ලක්ෂ හතර දක්වා අය -වැයෙන් වැඩි කළ බවත් ප්‍රකාශ කළද එම වැඩි කිරීමට අදාළ චක්‍රලේඛ මේ දක්වා නිකුත් කිරීමට ආණ්ඩුව අපොහොසත්ව ඇති බැවින් ඉදිරි තැපැල් ඡන්දයේදී රාජ්‍ය සේවකයන් පවතින ආණ්ඩුවට එරෙහිව දැඩි තීරණයක් ගනු ඇතැයි පොදුජන එක්සත් පෙරමුණේ ගොඩකවෙල ප්‍රදේශීය සභාවේ රක්වාන නගර අපේක්ෂක සංජීව සමන්ත මහතා පැවසීය.

හෙතෙම වැඩිදුරටත් මෙසේද කීය.

"බලය නැති කාල සීමාවේදී දැන් ආණ්ඩු පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් රාජ්‍ය සේවකයන්ගේ වැටුප රුපියල් 20,000කින් වැඩි කළ යුතු බවට වැඩ වර්ජන කිරීමට නායකත්වය දුන්නා. ඔවුන් බලයට පැමිණි පසු නව වැටුප් පරිවර්තනයක් සිදු කළා. පසුගිය ආණ්ඩු රාජ්‍ය නිලධාරියාගේ වැටුපට ලබා දීපු දීමනා වැටුපට එකතු කිරීම තමයි මේ වැටුප් පරිවර්තනය හරහා සිදු වුණේ. අමුතුවෙන් ලොකු මුදලක් වැඩි වෙන්නේ නැහැ. මේ සම්පූර්ණ වැටුප් වැඩි වීම ලබා ගැනීමට 2027 වර්ෂය දක්වා බලා සිටීමට රාජ්‍ය සේවකයාට සිදු වෙලා තියෙනවා. රක්වාන ප්‍රදේශයේ පවතින යටිතල පහසුකම් හා සරණ ඇවැසි ජනතාවගේ ජීවිත නඟා සිටුවීමට ප්‍රදේශීය සභාව තුළින් කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා."

## මාදු ගඟ **බලපිටියේ ධන උල්පතක් කරනවා**

### බලපිටිය ප්‍රාදේශීය සභා අපේක්ෂක-නිමල් ඒ. ද එස්. කනගරත්න (ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය)



**ගාල්ල දිස්ත්‍රික් සංචාරක ධර්මදාස සිරිවර්ධන**

ʻඅපි අවංකව රාජ්‍ය සේවයේ වැඩ කර විශ්‍රාම ගිහින් දේශපාලනයට ඇවිත් තිබෙන්නේ අපේ බඩ වඩා ගන්න නෙවෙයි. මෙවර බලපිටියෙ ජනතාවගෙ අඩුපාඩු හඳුනාගත් දක්ෂ අවංක පිරිසක් මෙවර ප්‍රාදේශීය සභාවට තරුව ලකුණින් ඉදිරිපත් වී තිබෙනවා.ʻ යැයි ලංකා කොමියුනිස්ට් පක්ෂයේ බලපිටිය ප්‍රාදේශීය සභා අපේක්ෂක නිමල් ඒ. ද එස්. කනගරත්න මහතා පැවසීය.

හෙතෙම වැඩිදුරටත් මෙසේද කීය.

"බලපිටිය කොමියුනිස්ට් පක්ෂයට බර ආසනයක්. ඒ නිසා අපි කයිවාරු ගහන්නෙ නෑ. හය වැනිදාට බලන්න මොකද වෙන්නෙ කියලා. 7 වැනිදාට බලපිටියෙ නව පෙරළියක් ඇති කරනවා. ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා, සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර, ශ්‍රීමත් ලලිත් රාජපක්ෂ වැනි දේශපාලන ලෝකයේ යෝධයන් බිහි වුණේ බලපිටියෙන්. බලපිටියේ පිහිටි මාදු ගඟ අපට ධන උල්පතක්. ඒත් පසුගිය කාලෙ ඒ සම්පත් නිදා ගත්තා. ඒ සියලුම පක්ෂවල අය බොරුවට විරුද්ධව වගේ ජනතාවට පේන්න කෑ ගහනවා. මේ සියල්ලෙන්ම මිදුණු වංචාව, දූෂණය, හොරකම නැති පිරිසුදු ප්‍රාදේශීය සභාවක් පිහිටුවමින් බලපිටිය දේශපාලන ඉතිහාසයේ අලුත්ම පිටුවක් පෙරළනවා."